වැළැක්වීම සරල ක්‍රියාවකි

REGIONE DEL VENETO
Servizio Socio Sanitario Regionale
In Universum Salus
VIVO BENE VENETO
Piano Regionale Prevenzione del Veneto

පියයුරු පිළිකා පරීක්ෂාව

එය කුමක්ද

මෙය පියයුරු පිළිකාව කල්තියා හඳුනා ගැනීම සඳහා නොමිලේ ලබා දෙන වැඩසටහනකි. එය ඔබට ආරාධනයට ප්‍රතිචාර දක්වා සහභාගී වීමට එකඟ වූ මොහොතේ සිට, රෝග විනිශ්චය දක්වාත්, හඳුනාගනු ලබන යම්කිසි තුවාලයකට අවශ්‍ය ප්‍රතිකාර ලබා දෙන තෙක්ත් ඔබ සමඟ ගමන් කරයි.

සම්පූර්ණ ප්‍රතිකාර මාර්ගයම ප්‍රාදේශීය සෞඛ්‍ය පද්ධතිය මගින් ආවරණය කෙරේ.
වෛද්‍යවරයාගේ නිර්දේශ පත්‍රය අවශ්‍ය නොවේ.

කා සඳහාද

වෙනෙටෝ කලාපයේ පදිංචිව හෝ තාවකාලිකව පදිංචිව සිටින වයස අවුරුදු 45 සිට 74 දක්වා කාන්තාවන්

කොපමණ වාරයක්

සෑම වසර 2කට වරක් මැමෝග්‍රැෆි (mammografia) නමින් හැඳින්වෙන විකිරණ විද්‍යාත්මක පරීක්ෂණයක් මගින්

සිදු කරන්නේ කෙසේද

මැමෝග්‍රැෆි පරීක්ෂණය සඳහා ගත වන්නේ මිනිත්තු කිහිපයක් පමණි. පියයුරු සම්පීඩනය කිරීමෙන් සුළු අපහසුතාවක් ඇති විය හැකි නමුත්, එය ඉක්මනින් පහව යයි. පින්තූර රේඩියෝලොජි විශේෂඥයින් දෙදෙනෙකු විසින් ස්වාධීනව පරීක්ෂා කරනු ලැබේ. පරීක්ෂණ දෙකක් අතර කාලය තුළ යම් රෝග ලක්ෂණ මතුවන්නේද යන්න පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ — උදාහරණයක් ලෙස, ගැටිත්තක්, පියයුරේ වේදනාවක්, තනපුඩුවෙන් ශ්‍රාවයක් පිටවීමක් හෝ හැඩයේ වෙනසක් — එවැනි රෝග ලක්ෂණ මතුවුවහොත්, ඊළඟ ආරාධනය ලැබෙන තෙක් බලා නොසිට ඒවා ඔබේ ප්‍රතිකාර කරන වෛද්‍යවරයාට දැනුම් දිය යුතුය.

ගමන් මාර්ගය

- නිවසේදී සහ ඉලෙක්ට්‍රොනික සෞඛ්‍ය වාර්තා පද්ධතිය (Fascicolo Sanitario Elettronico) හරහා ආරාධනය ලැබෙනු ඇත.
- ඔබට ඉලෙක්ට්‍රොනික සෞඛ්‍ය වාර්තාව (Fascicolo Sanitario Elettronico) හරහාද හමුවීමේ වේලාව වෙනස් කළ හැක.
- මැමෝග්‍රැෆි පරීක්ෂණයේ ප්‍රතිඵලය සෘණාත්මක නම්: ඔබට ඔබගේ ULSS වෙතින් දැනුම්දීමක් ලැබෙන අතර, වසර දෙකකට පසු ඊළඟ ආරාධනය ලැබේ.
- මැමෝග්‍රැෆි පරීක්ෂණයේ ප්‍රතිඵලය ධනාත්මක නම්: ඔබට ඔබේ ULSS වෙතින් දැනුම්දීමක් සහ වැඩිදුර පරීක්ෂණ සිදු කිරීමට ආරාධනයක් ලැබෙනු ඇත

ධනාත්මක මැමෝග්‍රෑම් පරීක්ෂණ ප්‍රතිඵලයක් තිබීමෙන් ගෙඩියක් ඇති බව අදහස් නොවේ: එය තවදුරටත් පරීක්ෂණ සිදු කළ යුතු බව පෙන්වයි. ඒ නිසාම, ඔබට යෝජනා කරන වැඩිදුර පරීක්ෂණ සිදු කර ගැනීම වැදගත් වේ.

මෙය කළ යුත්තේ ඇයි

පරීක්ෂණ මගින් පිළිකා තවමත් කුඩා අවධියේ පවතින විට ඒවා හඳුනාගත හැකිය.එසේ ඔවුන්ට ප්‍රතිකාර කිරීම වඩාත් පහසු වන අතර, ප්‍රතිවිපාක අඩු වී සුවය ලැබීමේ හැකියාවද වැඩි වේ.

පිළිකා පරීක්ෂණවලට සහභාගී වීම සරල ක්‍රියාවකි

වැඩිදුර තොරතුරු දැනගැනීමට සහ හමුවීමක් සඳහා වේලාවක් වෙන්කර ගැනීමට:
කලාපීය වෙබ් පිටුව හරහා ඔබගේ ULSS ආයතනය අමතන්න

නැතහොත් ඔබගේ ඉලෙක්ට්‍රොනික සෞඛ්‍ය වාර්තාව වෙත පිවිසෙන්න Fascicolo Sanitario Elettronico Sanità km zero

වැළැක්වීම සරල ක්‍රියාවකි

REGIONE DEL VENETO
Servizio Socio Sanitario Regionale
In Universum Salus
VIVO BENE VENETO
Piano Regionale Prevenzione del Veneto

මහා බඩවැල් සහ ගුද මාර්ග ආශ්‍රිත පිළිකා පරීක්ෂාව

එය කුමක්ද

එය මහා බඩවැල් හා ගුද මාර්ගයේ පිළිකා වැළැක්වීමේ නොමිලේ වැඩසටහනකි. මහා බඩවැල යනු මලපහ ගමන් කරන අන්ත්‍රයේ කොටසයි. එය අවසන් වන්නේ ගුද මාර්ගයෙනි; එය ගුද විවරය හරහා බාහිර පරිසරය හා සම්බන්ධ වේ. මෙම අන්ත්‍ර කොටසේ පොලිප් ලෙස හඳුන්වන ඉදිමීම් ඇති විය හැකි අතර, ඒවා වසර ගණනාවක් තුළ වර්ධනය වී පිළිකා බවට පත්විය හැක. ආරාධනය පිළිගෙන රෝග විනිශ්චයක් ලබා ගන්නා මොහොතේ සිට, හඳුනාගනු ලබන යම් හානියක් (lesion) සඳහා ප්‍රතිකාර ලබා දීම දක්වා වූ ක්‍රියාවලිය තුළ පරීක්ෂණ ක්‍රියාවලිය (screening) ඔබට සහාය වේ.

සම්පූර්ණ ප්‍රතිකාර මාර්ගයම ප්‍රාදේශීය සෞඛ්‍ය පද්ධතිය මගින් ආවරණය කෙරේ.
වෛද්‍යවරයාගේ නිර්දේශ පත්‍රය අවශ්‍ය නොවේ.

කා සඳහාද

වෙනෙටෝ (Veneto) කලාපයේ පදිංචි හෝ එහි ස්ථිර වාසය කරන වයස අවුරුදු 50ත් 74ත් අතර පිරිමි සහ කාන්තාවන්.

කොපමණ වාරයක්

සෑම වසර දෙකකට වරක්ම, නිරුවත් ඇසට නොපෙනෙන රුධිර අංශු හඳුනා ගැනීම සඳහා මල සාම්පලයක් පරීක්ෂා කිරීම මගින්

සිදු කරන්නේ කෙසේද

මෙම පරීක්ෂණය මගින් මලපහවල සැඟවුණු රුධිරය (occult blood) පවතීදැයි පරීක්ෂා කරනු ලැබේ. ලිපියේ සඳහන් කර ඇති, වැඩසටහනට සම්බන්ධ ඖෂධ අලෙවිසැලක් වෙත එම ආරාධනා පත්‍රය රැගෙන ගොස් පරීක්ෂණ නළය ලබා ගන්න. නිවසේදී මලපහ සාම්පලයක් කුඩා ප්‍රමාණයෙන් ලබාගෙන, එම බඳුන නැවත ඔසුසල වෙත භාර දෙන්න

tගමන් මාර්ගය

- නිවසේදී සහ ඉලෙක්ට්‍රොනික සෞඛ්‍ය වාර්තා පද්ධතිය (Fascicolo Sanitario Elettronico) හරහා ආරාධනය ලැබෙනු ඇත.
- පරීක්ෂණයේ ප්‍රතිඵලය සෘණාත්මක නම්: ඔබේ Azienda ULSS වෙතින් දැනුම්දීමක් ලැබෙන අතර, නියමිත කාල පරතරයෙන් පසු නැවත ආරාධනාවක් ලැබේ.
- පරීක්ෂණයේ ප්‍රතිඵලය ධනාත්මක නම්: ඔබගේ ULSS වෙතින් දැනුම්දීමක් සහ වැඩිදුර පරීක්ෂණ සිදු කිරීමට ආරාධනයක් ඔබට ලැබෙනු ඇත (කොලොනොස්කොපි පරීක්ෂණය, එය නිද්‍රාකාරකයක් ලබා දී සිදු කරනු ලැබේ).

ධනාත්මක පරීක්ෂණ ප්‍රතිඵලයක් ලැබීමෙන් ඔබට පිළිකාවක් හෝ පූර්ව-පිළිකාමය තුවාලයක් ඇති බව අදහස් නොවේ: එයින් අදහස් වන්නේ තවදුරටත් පරීක්ෂණ සිදු කිරීමේ අවශ්‍යතාවක් ඇති බවයි. ඒ නිසාම, ඔබට නිර්දේශ කරනු ලබන වැඩිදුර පරීක්ෂණ සිදු කරවා ගැනීම වැදගත් වේ.

මෙය කළ යුත්තේ ඇයි

ස්ක්‍රීනින් පරීක්ෂණ මඟින්, ඒවා ගෙඩියක් බවට පත්වීමට පෙර ඇතිවන තුවාල හෝ ගෙඩි තවමත් කුඩා අවධියේ පවතින විට හඳුනාගත හැක. එසේ ඔවුන්ට ප්‍රතිකාර කිරීම වඩාත් පහසු වන අතර, ප්‍රතිවිපාක අඩු වී සුවය ලැබීමේ හැකියාවද වැඩි වේ.

පිළිකා පරීක්ෂණවලට සහභාගී වීම සරල ක්‍රියාවකි

වැඩිදුර තොරතුරු දැනගැනීමට සහ හමුවීමක් සඳහා වේලාවක් වෙන්කර ගැනීමට:

කලාපීය වෙබ් පිටුව හරහා ඔබගේ ULSS ආයතනය අමතන්න

නැතහොත් ඔබගේ ඉලෙක්ට්‍රොනික සෞඛ්‍ය වාර්තාව වෙත පිවිසෙන්න Fascicolo Sanitario Elettronico Sanità km zero

වැළැක්වීම සරල ක්‍රියාවකි

REGIONE DEL VENETO
Servizio Socio Sanitario Regionale
In Universum Salus
VIVO BENE VENETO
Piano Regionale Prevenzione del Veneto

ගර්භාෂ ග්‍රීවා පිළිකාව සඳහා පරීක්ෂාව

එය කුමක්ද

මෙය ගර්භාෂ ග්‍රීවා පිළිකාව වැළැක්වීම සඳහා නොමිලේ ලබා දෙන පරීක්ෂණ වැඩසටහනකි. ගර්භාෂ ග්‍රීවාව යනු යෝනි මාර්ගය සහ ගර්භාෂය අතර සම්බන්ධ වන කොටසයි.
මෙම පිළිකාව ඇතිවන්නේ ලිංගික සම්බන්ධතා මගින් සම්ප්‍රේෂණය වන, බහුලව පැතිරී ඇති වෛරසයක් වන පැපිලෝමා වෛරසය (HPV) නිසාය. මෙම වෛරසයට එරෙහිව එන්නතක් පවතින අතර, එය වයස අවුරුදු 12ක් වන ගැහැණු සහ පිරිමි ළමුන්ට ලබා දෙන අතර, වෛරසය ආසාදනය වීම සහ එම වෛරසය හේතුවෙන් ඇතිවන පිළිකා වර්ධනය වීම වැළැක්වීම සඳහා ඵලදායී වේ. ආරාධනය පිළිගෙන රෝග විනිශ්චයක් ලබා ගන්නා මොහොතේ සිට, හඳුනාගනු ලබන යම් හානියක් (lesion) සඳහා ප්‍රතිකාර ලබා දීම දක්වා වූ ක්‍රියාවලිය තුළ පරීක්ෂණ ක්‍රියාවලිය (screening) ඔබට සහාය වේ.

සම්පූර්ණ ප්‍රතිකාර මාර්ගයම ප්‍රාදේශීය සෞඛ්‍ය පද්ධතිය මගින් ආවරණය කෙරේ.
වෛද්‍යවරයාගේ නිර්දේශ පත්‍රය අවශ්‍ය නොවේ.

කා සඳහාද

වෙනෙටෝ කලාපයේ පදිංචිව සිටින හෝ වාසය කරන වයස අවුරුදු 25 සිට 64 දක්වා කාන්තාවන්.

කොපමණ වාරයක්

වයස අවුරුදු 25 සිට 29 දක්වා: සෑම වසර 3කට වරක් (Pap පරීක්ෂණය සමඟ)වයස අවුරුදු 30 සිට 64 දක්වා: සෑම වසර 5කට වරක් (HPV පරීක්ෂණය සමඟ).

වයස අවුරුදු 15ට පෙර HPV එන්නත ලබාගත් කාන්තාවන් පරීක්ෂණයට ලක් කිරීම ආරම්භ කරන්නේ වයස අවුරුදු 30දී ය. එයට හේතුව ඔවුන්ට පිළිකා ඇතිවීමේ අවදානම ඉතා අඩු වීමයි

සිදු කරන්නේ කෙසේද

ගැබ්ගෙල ප්‍රදේශයෙන් ලබාගන්නා ස්වැබ් පරීක්ෂණය වේදනාකාරී නොවන නමුත්, තරමක් අපහසුතාවයක් ඇති කළ හැකි අතර, එය සිදු කිරීමට ගත වන්නේ මිනිත්තු කිහිපයක් පමණි. මාසික ඔසප් චක්‍රය අතරතුර මෙය සිදු නොකරනු ලැබේ: ඔබගේ හමුවීම නියම කර ඇති දිනයේ ඔසප් වීම සිදුවන්නේ නම්, එය වෙනත් දිනයකට මාරු කර ගැනීම සඳහා ඔබේ ULSS ආයතනය අමතන්න.

ගමන් මාර්ගය

- නිවසේදී සහ ඉලෙක්ට්‍රොනික සෞඛ්‍ය වාර්තා පද්ධතිය (Fascicolo Sanitario Elettronico) හරහා ආරාධනය ලැබෙනු ඇත.
- ඔබට ඉලෙක්ට්‍රොනික සෞඛ්‍ය වාර්තාව (Fascicolo Sanitario Elettronico) හරහාද ඔබගේ හමුවීමේ වේලාව වෙනස් කළ හැක
- පරීක්ෂණයේ ප්‍රතිඵලය සෘණාත්මක නම්: ඔබේ Azienda ULSS වෙතින් දැනුම්දීමක් ලැබෙන අතර, නියමිත කාල පරතරයෙන් පසු නැවත ආරාධනාවක් ලැබේ.
- පරීක්ෂණයේ ප්‍රතිඵලය ධනාත්මක නම්: ඔබට ඔබේ ULSS වෙතින් දැනුම්දීමක් සහ වැඩිදුර පරීක්ෂණ සිදු කරන ලෙස ආරාධනයක් ලැබේ (කොල්පොස්කොපි පරීක්ෂණයක් සමඟ නාරිවේද පරීක්ෂාව). HPV පරීක්ෂණයේ ප්‍රතිඵලය ධනාත්මක වුවත්, එම සාම්පලයෙන්ම සිදු කළ පැප් පරීක්ෂණයේ ප්‍රතිඵලය සෘණාත්මක නම්, වසරකට පසු HPV පරීක්ෂණය නැවත සිදු කිරීමට ඔබට යෝජනා කරනු ලැබේ.

මෙය කළ යුත්තේ ඇයි

ස්ක්‍රීනින් පරීක්ෂණ මඟින්, ඒවා ගෙඩියක් බවට පත්වීමට පෙර ඇතිවන තුවාල හෝ ගෙඩි තවමත් කුඩා අවධියේ පවතින විට හඳුනාගත හැක. එසේ ඔවුන්ට ප්‍රතිකාර කිරීම වඩාත් පහසු වන අතර, ප්‍රතිවිපාක අඩු වී සුවය ලැබීමේ හැකියාවද වැඩි වේ.

පිළිකා පරීක්ෂණවලට සහභාගී වීම සරල ක්‍රියාවකි

වැඩිදුර තොරතුරු දැනගැනීමට සහ හමුවීමක් සඳහා වේලාවක් වෙන්කර ගැනීමට:
කලාපීය වෙබ් පිටුව හරහා ඔබගේ ULSS ආයතනය අමතන්න

නැතහොත් ඔබගේ ඉලෙක්ට්‍රොනික සෞඛ්‍ය වාර්තාව වෙත පිවිසෙන්න Fascicolo Sanitario Elettronico Sanità km zero